**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2022**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ , 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ වත්කම් අපහරණයෙන් ලද රු. 286,775 ක් වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එම වත්කම්වල පිරිවැය වූ රු.737,477 ක් දක්වා තිබීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 450,702 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වත්කම් අපහරණයෙන් ලද ආදායම ලෙස රු. 286,775 ක මුදල පෙන්විය යුතු බව පිළිගනිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට වත්කම් අපහරණයෙන් ලද මුදල් ලැබීම් පමණක් ඇතුළත් කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ දෙහිවල පැළ අලෙවිසැලේ රු. 81,960 ක පැළ විනාශ වී ඇතත් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් නොකිරීම නිසා ලාභය හා අවසන් තොගයේ අගය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය තුළ පැළ මිය යාම් වටිනාකම රු.81,960 ක් වුවද 2022.12.31 දිනට භෞතික තොග ගණනයේ දී එදිනට පැවති රු. 9,690 ක් අවසාන ගිණුම් සකස් කිරීමේ දී තොග හානි ලෙස ගෙන ඇත. | වර්ෂයට අදාළ සම්පූර්ණ හානියම ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කොළඹ ප්‍රදේශයේ බිස්කට් නිෂ්පාදනය කරන පුද්ගලික සමාගමක් හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය සමඟ බඩඉරිඟු වගාකර සැපයීමේ ව්‍යාපෘති ගිවිසුමකට එළඹී එම ගිවිසුම ප්‍රකාරව පෞද්ගලික සමාගම රු. 18,000,000 ක මූල්‍ය දායකත්වයක්ද, කාර්යාංශය විසින් ශ්‍රම සැපයීම මත මෙම නිෂ්පාදන කාර්යයන් ආරම්භ කර තිබුණි. එහි වියදම් ලෙස රු.15,002,995 ක් දරා තිබුණද අදාළ කාර්ය නිම නොවී තිබියදී එම දරන ලද වියදම හා ලැබීම් වෙනම ව්‍යාපෘති ගිණුමක දැක්වීම වෙනුවට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් හා ආදායම් එම වටිනාකම් වලින් වැඩියෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය. | ප්ලේන්ටි ෆුඩ්ස් පුද්ගලික සමාගම හා පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාංශය එක්ව මණ්ඩලය සමඟ ගිවිසුම් ගතව සිදු කළ ආදායම් හා වියදම් මණ්ඩලයේ ආදායම් හා වියදම් ලෙස ගෙන ඇති බව පිළිගනිමි. එය එසේ නොකිරීමෙන් සැඟවුණු ආදායමක් සහ වියදමක් ලෙස පෙන්නුම් කෙරේ. එය ඉදිරි වසරේ දී වෙනම ගිණුමකින් පෙන්වීමට කටයුතු කරමි. | ව්‍යාපෘතියේ ආදායම් හා වියදම් වෙනම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලය විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරනු ලබන කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් යතුරු පැදි 02 ක, මෝටර් රථයක හා සුළු අපනයන බෝග | මෙම පවරාගැනීම සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත | යතුරුපැදි හා වාහනවල අයිතිය පවරා ගෙන මූල්‍ය |

| | | |
|---|---|---|
| ප්‍රවර්ධන මණ්ඩලයට අයත් මෝටර් රථයක අයිතිය මණ්ඩලය වෙත පවරා ගෙන ඒවා අගය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 වර්ෂයේදී නාරාහේන්පිට හෙල්දි ෆුඩ් භෝජනාගාරයේ සිදු වූ රු. 73,415 ක් වටිනා මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විමර්ෂණය සිදු කර අලාභ අයකර නොතිබුණි. | 2012 වර්ෂයේ දී නාරාහේන්පිට හෙල්දිෆුඩ් භෝජනාගාරයේ සිදු වූ මූල්‍ය අක්‍රමිකතාවට අදාළ මුදල අයකර ගැනීමට කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් දන්වා ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමි. | මූල්‍ය අලාභය අය කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යය සාධන වාර්තාව ගිණුම් සමඟ ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පනත අනුව කටයුතු කිරීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 104 | 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ රු. 4,094,596 ක් වටිනා සෝයා බෝංචි කි.ග්‍රෑ. 37,223 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව රහස් පොලිසිය සහ වංචා හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ පරීක්ෂණ තවමත් සිදු කරමින් පවතියි. | පරීක්ෂණයක් සිදු කර අලාභය වගකිව යුතු පාර්ශවවලින් අය කරගත යුතුය. |
| | (ii) මු.රෙ. 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෞද්ගලික සැපයුම්කරුවන් 30 දෙනෙකුගෙන් ලැබී තිබුණු වර්ෂ 02 ක ඉක්මවූ රු. 78,472,024 ක තැන්පතු ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැව් ව්‍යාපෘතියට අදාළ ලැබී ඇති මුදල් ස්ථාවර තැන්පත් ගිණුම් වල ආයෝජනය කර ඇත. | කල් ඉකුත් වූ තැන්පතු කඩිනමින් නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 16,020,225 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු. 3,828,645 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 19,848,870 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පොලී ආදායම රු. 15,267,035 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ ප්‍රවර්ධනය කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර / අමාත්‍යාංශ ප්‍රදාන, වෙනත් මෙහෙයුම් ආදායම්, පොලී ආදායම් හා වෙනත් ආදායම් පිළිවෙළින් සියයට 25, 168, 137 හා 4371 ක් වැඩි වී තිබුණු අතර සේවක පරිශ්‍රමික වියදම සැපයුම් හා අවශ්‍යතා වියදම් හා ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා, හා වෙනත් වියදම් හා ස්ථාවර වත්කම් අලුත්වැඩියා නඩත්තු වියදම්ද පිළිවෙළින් සියයට 12, 124, 163 හා 24 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු කිරීම වෙනුවෙන් රු. 3,370,595 ක වියදමක් දරා එම පස් විකිණීමෙන් රු. 81,134,631 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමඟ යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු. 77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඇති බලතල යටතේ "මණ්ඩලය විසින් කරනු ලබන සේවයන් සඳහා ගාස්තු නියම කර, අයකර ගැනීමට යටත්ව" දක්ෂිණ අධිවේගී මාර්ගය සංවර්ධන කටයුත්ත සඳහා වසර ගණනාවක් කැණීමට ලක් නොවූ වැව් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය ඇතිව සහ වෙනත් රජයේ ආයතනවල පූර්ව නිෂ්කාශණ කටයුතු ලබා ගනිමින් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන් අදාළ බලපත්‍ර ලබා දීම වෙනුවෙන් අප ආයතනයේ සේවාවන් වෙනුවෙන් ගාස්තු අයකර තැන්පතු මුදල ගොඩනගා ඇත. මෙම මුදල් ගොවි සංවිධාන වලට අදාළව වැව් ප්‍රතිසංස්කරණ හෝ වෙනත් සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් උපදෙස් දී තිබුණද කාලානුරූපව පත්වූ විෂයභාර අමාත්‍යවරුන් ලබා දුන් උපදෙස් මත රජයෙන් හා පළාත් සභා වලින් මෙකී වැව් සංවර්ධනය සඳහා මුදල් වෙන් වන බැවින් මෙම තැන්පත් මුදල් වියදම් නොකිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ පැවති සාකච්ඡා වලදී තීරණය විය. වර්තමානය වන විට එම තැන්පතුව | මණ්ඩලයේ පනතට අනුව කාර්යයන් සිදු කළ යුතුය. ස්ථාවර තැන්පතුවල ඇති මුදල් මණ්ඩලයේ බලතල සඳහා උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හේතුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන අඩුකර ඇති අතර හිඟ මුදල් මණ්ඩලය මඟින් දැරීමට සිදු වී ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී තණමල්විල ගොවිපොළෙහි ඇති සාගිනි වැව ප්‍රතිසංස්කරණයේ කොටසක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකර තිබුණු අතර ඉතිරි වැඩ කොටස් සඳහා රු.1,597,201 ක් සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් ගෙවීමට එකඟතාවය පලකර ඒ සඳහා රු. 500,000 ක අත්තිකාරම් මුදලක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදී ඇතත් වැවේ ඉතිරි කාර්යයන් නිසිපරිදි නිමකර ගොවිපොළෙහි වගාවන් සඳහා ජලය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | තණමල්විල වැව ඉදි කිරීමේ අඩුපාඩු පිළිබඳව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් සමඟ ඉදිරියේ දී රැස්වීමක් පැවැත්වීමට නියමිතය. | වැව ප්‍රයෝජනයකට ගත හැකි පරිදි අදාළ කාර්යයන් නිමකර වගා කටයුතු කළ යුතුය . |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පැළ තවාන්, සාම්ප්‍රදායික සහල් අලෙවි ව්‍යාපෘතිය හා ගොවිපොළවල කටයුතු වැනි ව්‍යාපෘති 13 කින් ව්‍යපෘති 09 ක් ශුද්ධ අලාභයන් ලබා තිබුණු අතර එම ව්‍යාපෘති 09 හි ශුද්ධ අලාභය රු. 12,511,507 ක් විය. | නිරීක්ෂණය හා එකගවේ. ඉදිරි වසරේ දී රාජ්‍යය පෞද්ගලික හවුල් කාරිත්වය යටතේ නව ව්‍යාපෘති සිදු කිරීමට සැලසුම් කර ඇත. | පවත්නා ව්‍යාපෘති ලාභ ලැබෙන ලෙස පවත්වා ගත යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සටහන් වල ඇතුළත්ව ඇති රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු. 691,211 ක් වූ ලැබිය යුතු ශේෂ වර්ෂ 08 කට වැඩි කාලයක සිට පැවති අතර ඒවා නිරවුල් කිරීමට ක්‍රියාකර නොතිබුණි. | එම ණයගැති ශේෂ 2011 හා 2012 වසර වල ඇතිවූ ශේෂයන් වේ. ඊට අදාළ මු.රෙ.104 පරීක්ෂණ වාර්තාව ලැබී ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු කරමි. | ණයගැති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 62,382 ක් වූ උපචිත වියදම් වර්ෂ 03 කට වැඩි කාලයක සිට පවතින අතර ඒවා නිරවුල් කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. එම මුදල් ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. එම මුදල් අතර හෙල්දිඹුඩ් ව්‍යාපෘතියට අදාළව අයවීමට ඇති ණය අයකර ගන්නාතුරු රඳවාගත් තැන්පතුද පවතී. | උපචිත වියදම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | තණමල්විල හා බුත්තල ගොවිපොළ වල අයිතිය වසර 30 ක දිගුකාලීන කල්බදු පදනම යටතේ මණ්ඩලය වෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබාගෙන ඇති බව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර තිබුණද ඊට අදාළ බලපත්‍ර මණ්ඩලය සතුව නොතිබුණි. | ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉඩම් වල අයිතිය පවරාගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **තණමල්විල ගොවිපොළ** | | |
| (i) | 2020 වර්ෂයේදි රු 600,000 .ක් වැයකර කාබනික පොහොර සැකසීමේ ගොඩනැගිල්ල ඉදි කර ප්‍රයෝජනයට නොගෙන එය නිෂ්කාර්යව තිබියදි සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි කාබනික පොහොර මෙ.ටො. 329ක් නිෂ්පාදනය හා තවත් කාබනික පොහොර ඒකකයක් පිහිටුවීම සඳහා රු.3,950,000 ක් වෙන්කර ඇතත් එම කිසිදු කටයුත්තක් සිදු කර නොතිබුණි. | වගා ව්‍යාපෘති සැලසුම්කර තිබුණද වැව ප්‍රතිසංස්කරණ නොකළ නිසා ව්‍යාපෘතීන් කිරීමට නොහැකි විය. කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියට අමුද්‍රව්‍ය සොයාගැනීමේ අපහසුතාවය, අමුද්‍රව්‍ය සඳහා පැවති අධික ඉල්ලුම හමුවේ අමුද්‍රව්‍ය හිඟ වීම සහ ඉහළ ඉන්ධන මිල හමුවේ ප්‍රවාහන වියදම් අධික වීම වැනි හේතූන් මත නිෂ්පාදනය සිදුකිරීමට නොහැකි විය. කෘෂි යෙදවුම් අලෙවිසැල් මගින් අලෙවි කිරීමට සැලසුම් කළද, අධික ප්‍රවාහන වියදම නිසා මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි සිදු නොවුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී පවත්නා වෙළෙඳ පොළ, නිෂ්පාදන පිරිවැය, අමුද්‍රව්‍ය පැවතීම ආදි ඊට බලපාන සියලුම සාධක පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. |
| (ii) | පසුගිය සහ සමාලෝචිත වර්ෂ වල ක්‍රියාකාරී සැලැස්මේ ජාතික බීජ නිෂ්පාදනයට සහය වීම සඳහා එම ගොවිපොළ යොදාගැනීම වෙනුවෙන් පිළිවෙළින් රු.500,000 ක් සහ රු. 1,000,000 ක් වෙන්කර තිබුණද එම කාර්යය සිදුකර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම්කළ පරිදි නිම නොකළ නිසා නිසි ජල සම්පාදන ක්‍රමවේදයකින් තොරව යෝජිත වගා ව්‍යාපෘතීන් සිදුකිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **බුත්තල ගොවිපොළ** | | |
| (i) | පෞද්ගලික ආයෝජකයෙකුට බුත්තල ගොවිපොළෙහි 2021 අප්‍රේල් 05 දින සිට මණ්ඩලයේ නාමය භාවිතා කරමින් කාබනික පොහොර නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉඩකඩ ලබාදී තිබුණි. එහි නිෂ්පාදන සාම්පල් පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් පර්යේෂණ ආයතනයක් වන තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉදිරිපත් කළ විශ්ලේෂණ වාර්තාව අනුව ඒවා ප්‍රමිතියෙන් ඉතා අවම මට්ටමක පවතින බව දන්වා තිබියදීත් ප්‍රමිතිය පිළිබඳ නොසලකා සමාලෝචිත වර්ෂයේදී කාබනික පොහොර හා බඳුන් මිශ්‍රණ කිලෝ ග්‍රෑම් 166,500 ක් මණ්ඩලයේ නාමය යටතේ අලෙවි කර තිබුණි. | මෙම ව්‍යවසායකයා සමඟ ආරම්භක අවස්ථාවේ සිට කාබනික පොහොර නිෂ්පාදනය සිදු කරයි. විමසුමේ දක්වා ඇති තත්වය 90% ට වඩා වෙළඳපල කාබනික පොහොර නිෂ්පාදන තුළ දක්නට තිබුණි. එයට හේතු වූයේ කාබනික පොහොර සඳහා අලුතින් සකස් කරන ලද නයිට්‍රජන් ප්‍රමාණය කාබනික පොහොර සඳහා යොදන ඓන්ද්‍රිය ද්‍රව්‍යන්ගෙන් පමණක් ලබා ගැනීම අපහසුවීම හා උසස් තාක්ෂණය යොදා ගැනීමේ පහසුකම අප වෙනුවෙන් කාබනික පොහොර නිෂ්පාදනය කරන ව්‍යවසායකයා වෙත ලබා දීමට අපොහොසත්වීම හේතුවෙන් කාබනික පොහොර නිෂ්පාදනය තාවකාලිකව නතර කරන ලදි. කාබනික පොහොර සඳහා විශේෂ පහසුකම් අමාත්‍යාංශය විසින් ලබා දුන් කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙන් කාබනික පොහොර මිලදී ගැනීම සිදුකරන ලදි. එබැවින් බුත්තල ව්‍යවසායකයාගෙන් බඳුන් මිශ්‍රණය පමණක් මිල දී ගැනීම සිදු කරන ලදී. | පාරිභෝගිකයන්ට නිසි ප්‍රමිතියට අනුකූල උසස් තත්ත්වයේ පොහොර සැපයීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මණ්ඩලය විසින් බීජ කහ ඉල්ලුම සපුරාලීම සඳහා දායකත්වය දැක්වීම අරමුණු කරගෙන බුත්තල ගොවිපොළෙහි අක්කර 2.5 ක බීජ කහ කිලෝ ග්‍රෑම් 2,500 ක් වගා කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,345,544 ක් සහ පසුගිය වර්ෂයේදී රු. 2,104,383 ක් ලෙස එකතුව රු. 3,449,927 ක් වැයකර තිබුණි. නිෂ්පාදනයෙන් අපේක්ෂිත කහ අස්වැන්න කිලෝ ග්‍රෑම් 15,167 වුවත් සත්‍ය අස්වැන්න කිලෝ ග්‍රෑම් 1,710 ක් ලෙස අපේක්ෂිත ඵලදාව සියයට 89කින් අඩුවී තිබුණි. 2023 මාර්තු 24 දින දක්වා එම කහ තොගය අලෙවි කිරීමට පියවර ගෙන නොතිබුණි. ඒ සඳහා දරන ලද සම්පූර්ණ මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | කහ වගාවේ ජලසම්පාදනයට නල ළිඳක් ඉදිකිරීම සිදුකළද පුරෝකථනය කරන ලද පරිදි ජලය නොලැබීම මෙම වගාව සාර්ථක නොවීමට හේතු විය. කෘෂිකර්ම අමාත්‍යාංශයේ නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයන් බවට බල ගැන්වීමේ වැඩසටහනේ කහ සැකසුම් කළ හැකි යන්ත්‍ර වල ඵලදායිතාවය හා නිෂ්පාදනවල තත්ව පරීක්ෂණ කටයුතු වෙනුවෙන් කහ වගාවේ අස්වැන්න වූ කිලෝග්‍රෑම් 1710 මේ සඳහා යොදවන ලදි. මෙම පර්යේෂණ කටයුතු වලදී වියලන ලද කහ, කුඩු කර වෙළඳපලට ඉදිරියේ දී නිකුත් කිරීමට කටයුතු කරමි. | ලබාගත හැකි ජලය ප්‍රමාණය වැරදියට පුරෝකථනය කළ කොන්ත්‍රාත්කරු ගෙන් ළිඳ ඉදි කිරීමට දරන ලද පිරිවැය අයකර ගැනීම හෝ වෙනත් ළිඳක් ඉදි කරවාගෙන ව්‍යාපෘතිය සාර්ථක කරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.16,020,225 ක ශුද්ධ ලාභය සඳහා සෘජුවම රු. 26,392,996 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම දායක වී ඇති අතර මණ්ඩලය විසින් සිදුකරන අනෙකුත් ව්‍යාපෘති සතුටුදායක නොවන කාර්යසාධන මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය හා එකගවේ. ඉදිරි වසරේ දී ලාභය වැඩිකර ගැනීමට කටයුතු කරමි. | ව්‍යාපෘති සතුටුදායක කාර්යසාධන මට්ටමක පවත්වා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ කලංකුට්ටිය සහල් පිටි සැකසුම් ඒකකයේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවක් සිදුකර නොතිබුණු අතර එහි පැවති යන්ත්‍ර 03 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | කලංකුට්ටිය සහල් පිටි කිරීමේ යන්ත්‍රයට වඩා උසස් ප්‍රමිතියකින් හා යුත් පිරිවිතරයන් ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ ඇති යන්ත්‍ර සතුව ඇත.තවද එහි කාර්යක්ෂමතාවය ද ඉහල නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමේ අරමුණින් මෙම පර්යේෂණ ඒකකයේ ඇති යන්ත්‍ර භාවිතා කරයි. | කලංකුට්ටිය සහල් පිටි සැකසුම් ඒකකයේ යන්ත්‍ර භාවිතයට ගැනීම හෝ වෙනත් කටයුත්තක් සඳහා ඉදිරි සැලසුම් ඇති කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018, 2019, 2020 හා 2021 වර්ෂවල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | මේ වන විට සියලුම වාර්ෂික වාර්තා සකස් කර ඇත. 2018,2019,2020 වාර්ෂික වාර්තා කැබිනට් මණ්ඩලය වෙත යොමු කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර දී ඇත.2021 වාර්ෂික වාර්තා නිරීක්ෂණය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට යවා ඇත. 2022 වාර්ෂික වාර්තාව අවසාන විගණන වාර්තාව ලද පසු යැවීමට කටයුතු කරමි. | නොපමාව අදාළ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |